# මී මැස්සෝ ඔයයි මමයි



# මී මැස්සෝ ඔයයි මමයි

තසුනි දහම්ලි රූබසිංහ

**රචනය හා චිත්‍ර -**

**තසුනි දහම්ලි රූබසිංහ**

**ISBN-9786242068312**

පළමු මුද්‍රණය -

2023.12.05

කතුවරියගේ වෙනත් කෘති-

* පුංචි දියකිඳුරිය
* වැලක මලක් හරි පුදුමෙක් එහිගෙඩියක්

තසුනි දහම්ලි රූබසිංහ

3 D ශ්‍රේණිය

මහාමායාබාලිකා විද්‍යාලය

පිදුම

පිණිකැට පොඩි පොඩි

වැටෙනා විලසට

අකුරු එකතුකොට

ඇමිණුව තාලෙට

මම ආසම මගෙ

මී මැස්සෝ ඔයයි මමයි

පුදන්නම් බැතියෙන්

මගේ ගුරු මවුපියවරුණි

සෙනෙහෙබර.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

මිනිස්සුන්ට ඉතාවටිනා ඖෂධයක් ලබාදෙන මම  මී මැස්සෙකි.ඔයාලා දන්නවද මට යාලුවෝ සහ දරුවෝ ගොඩක්  ඉන්නවා.

අපි හැමෝම ඉන්නේ ලස්සන පුංචි ගෙදරක. අපි හැමෝම සමගියෙන් ඉන්නවා.  ඒ නිසා අපේ ගෙදර ගොඩාක් අය ඉන්නවා පිරිමි මැස්සන්, මෙහෙකාර මැස්සියන්, පිලව් මේ හැමෝගෙම අම්මා තමයි මම. මම තමයි මී මැසි රැජී ණ .





සුබ උදෑසනක් වේවා! චූටි පැටියෝ ඔයා මොකද කරන්නේ ?

සුබ උදෑසනක් වේවා රැජිණියනි.

මම මේ අපේ කුටි පිරිසිදු කරන ගමන් බිත්තර ආරක්ෂා කරනවා

බොහොම හොඳයි. මගේ චූටි මී මැස්සී.

අම්මට කොහොමද? මම හොඳින් ඉන්නවා පැටියෝ

දරුවනේ ඔයාලා මොකද කරන්නේ?

අපි වයසින් වැඩි පිලවුන් පෝෂණය කරනවා

එන්න අම්මේ,

,බොහොම හොඳයි මගේ දරුවනේ.ඔයාලා වැඩ කරන්න.

අද හරිම ලස්සන දවසක්.

කඳු අතරින් ඉර පායලා ගස්වල මල් පිපිලා ගෙඩි හැදිලා



# ඇත්තටම මගේ

දරුවොයි, මගේ නෑදෑයොයි මල්වල පරාගනය සිදු කිරීමට කොයිතරම් නම් උදව් කරනවද? ඒ නිසානේ ගස්වල ගෙඩි හැදෙන්නේ. ඇත්ටම අම්මේ ගස් වල ගෙඩි හැදෙන්නේ නැත්නම් මිනිස්සු මොනවද කන්නේ?

ඔව් එයාලගේ කෑම අතර වැඩිපුරම තියෙන්නේ ගස්වල හැදෙන ගෙඩි, කරල් ,මල් ,වගේ දේවල්.

ඒවාගෙන් තමයි එයාලා පෝෂණය ලබාගන්නේ. එ විතරක් නෙවෙයි. එයාලා අපි මහන්සි වෙලා රැස්කරන පැණිටික හොරකම් කරනවා අපේ පැණි ලෙඩවල් සුව කරන වටිනා ඖෂධයක්ලු.



අම්මේ එතකොට මිනිස්සු නරකයිද?

හැමෝම නරක නෑ හොඳ වැඩ කරන අයත් ඉන්නවා

ඒක තමයි අපේ යාළුවා තසුනි හරිම හොඳ බබෙක්.

අම්මේ මිනිස්සු අපේ පැණි ගන්නවා අපිට තවත් කරදර කරනවාද?

ඇයි නැත්තේ එයාලා අපේ පැණි ගන්න එන්නේ ගින්දර පත්තු කරගෙන අපේ අය ගොඩක් පිච්චිලා මැරෙනවා ඒ වෙලාවට.

එයාලා අපේ පැණි හොරකම් කරනකොට අපේ අය මොකද කරන්නේ?





ඒ වගේ වෙලාවට අපේ අයත් මිනිස්සුන්ට දෂ්ට කරනවා
අනේ  අම්මේ මේ හැමෝම හරිම පව්.
ඔව් පුතේ
අපේ ජනපදයේ ඉන්න අපේ නෑදෑයෝ
ජනපදය ආරක්ෂාකරන්න
ගොඩක් මහන්සි වෙනවා.ජීවිතෙන් පවාවන්දි ගෙවනවා
අම්මේ අපි මිනිස්සු නැති ලෝකයක් හොයාගෙන යමුද?
එතකොට අපට නිදහසේ ජීවත් වෙන්න පුළුවන්නේ.
එහෙම කියන්න එපා චුටි මිනිස්සු හැමෝම නරක නැහැ

තසුනි, බබා කොච්චර හොඳ යහළුවෙක්ද.? එයත් එයාගේ පවුලේ අයත් අපිට හරිම ආදරෙයි.

ඔව් චූටි පැටියෝ ඔයාගේ යහළුවා වගේ හොඳ අය මේ මිනිස්සු අතරේ ඉන්නවා

අම්මේ තසුනි බබා මල් වත්තට ඇවිත්.

මම ගිහින් සෙල්ලම් කරලා එන්නද?

පරිස්සමින් චූටි අක්කලත් එක්ක යන්න.



ආ...තසූ බබා සුබ උදෑසනක් වේවා!

සුබ උදෑසනක් වේවා! චූටි මී මැස්සි.

අද මල් වත්ත හරිම ලස්සනයි.පාට පාට සුවඳ හමන මල් පිරිලා

මට හරිම සතුටුයි.චූටි

ඔයාලා නිසා තමයි මේ ලෝකෙ මෙච්චර ලස්සන.





මම ඔයාට සතුටු හිතෙන ආරංචියක් කියන්නයි ආවේ.

ඒ මොකක්ද තසූ බබා?

අපේ තාත්තා කිව්වා

ඔයාලට නිදහසේ ජීවත්වෙන්න ලස්සන පරිසරයක් හදනවා කියලා.

ඒ මොකක්ද තසු බබා ?

මේ පරිසරය ඔයාලට වෙන් කරනවා කිව්වා


අපේ අයගෙන් ඔයාලට කවදාවත් හිරිහැර නොවෙන්න.

ඔයාලා මේ ලෝකෙට ලොකු සේවයක් කරන පිරිසක්.මේ ලෝකය මෙහෙම ලස්සන වෙන්නේ ඔයාලගෙන්

විශාල සේවයක් වෙන නිසයි.

ඒ නිසා මේ ලස්සන ගම ඔයාලට දීලා අපි නගරයට යනවා.





එතකොට මම ඔයා එක්ක සෙල්ලම් කරන්නේ කොහොමද?

මම ඔයාලා බලල යන්න එන්නම්.

හා. එතකොට මම ඔයාට පැණි එකතු කරලා දෙන්නම්.

එහෙනම් චූටි මී මැස්සි මම ගිහින් එන්නම්.
මමත් ඉක්මනට ගිහින් අම්මට මේ සතුටුදායක
ආරංචිය කියන්නම්.
ඔයාලට බොහොම ස්තුතියි.



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වු මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වුයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01



# ස්තුතිය

කතන්දරයක් ලියන්න අපට

අවස්ථාව ලබා දුන් එම්.එම්.සෙනවිරත්න ගුරු
පියාණනටත්,සමන්මලී ගුරුමෑණියන්ටත්,
චම්පිකා ගුරමෑණියටත්, මගේ ආදර අම්මිටත්,
තාත්තිටත් ,පොත සකස්කර දුන් මගේ සුදු අයියා
ටත්,සහන් අයියාට ත්

ස්තුතිවන්ත වෙමි.

තසුනි දහම්ලි රුබසිංහ

මහ/මහාමායා බාලිකාවිද්‍යාලය ,මහනුවර